# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.06.02 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : ඩබ්. ප්‍රේමරත්න මයා
‘අරුණ’,
තිත්ත වැල්ලගොඩැල්ල පාර,
බෝම්බුවල,
කළුතර.

වගඋත්තර පාර්ශවය : 01. පො. ප. ගයාන් ක්‍රිශාන්ත මයා,
ස්ථානාධිපති (අපරාධ අංශය),
පොලිස් ස්ථානය, කළුතර දකුණ.
(පයාගල පොලිස් ස්ථානය. වර්තමාන සේවා ස්ථානය)

02. පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන මයා,
පොලිස් ස්ථානය, කළුතර දකුණ.
(මතුගම පොලිස් ස්ථානය. - වර්තමාන සේවා ස්ථානය)

03. පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර මයා,
පොලිස් ස්ථානය
කළුතර දකුණ.

04. පො. කො. 66782 ටී. කේ. කේ. ශ්‍රීමාල් මයා,
පොලිස් ස්ථානය
කළුතර දකුණ.

**පැමිණිලි අංක HRC/3423/24**

උක්ත පැමිණිලි අංකය යටතේ පැමිණිලිකරු විසින් 2024-08-06 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමා 2020 වසරේ සිට රේගු දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරියෙකු වශයෙන් සේවය කරන බවත්, ඊට අමතරව තමා ස්වේච්ඡා සමාජ සේවකයෙක් වශයෙන් කළුතර වෙරළ තීරය හා කලුගං තොට වෙරළ උද්‍යානයේ පරිසර සංරක්ෂණ වැඩසටහනේ, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා Clean Ocean Force සංවිධානයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත. එම සංවිධානය විසින් 2024.07.26 දිනට යෙදී තිබූ ලෝක කඩොලාන දිනය සැමරීම සඳහා සූදානම් කරන ලද සැමරුම් උත්සවයට අදාළ සංවිධාන කටයුතු තමා ඇතුළු පිරිස විසින් 2024.07.20 දින සිදු කළ බවත්,


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.<br>இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04.<br>No. 14, R. A. De Mel Mawatha, Colombo 04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011 - 250 5451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 250 5541/74 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com | | | | |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 - 250 5521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | | | |

2024.07.21 වන දින තමා කළුතර වෙරළ තීරයේ සංරක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා තමාගේ පුතා ද සමග තමාගේ ත්‍රීරෝද රථයෙන් ශ්‍රමදාන කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ද රැගෙන පෙ.ව. 10.00 ට පමණ කළුතර දකුණ වෙරළ තීරයට පැමිණි බවත්, තම පුත්‍රයා කළුතර දකුණ දුම්රිය ස්ථානයට පිවිසෙන දොරටුවට මදක් ආසන්නයේ ත්‍රීරෝද රථය නතර කර පුත්‍රයා එහි රඳවා, තමා දුම්රිය ස්ථානයේ දකුණු අන්තයේ පිහිටි ගේට්ටුවෙන් වෙරළ තීරය දෙසට ගමන් කළ බවත් ප්‍රකාශ කර ඇත. එම ස්ථානයේ වෙරළ රැකබලා ගැනීම සඳහා සිටින පුද්ගලයින් දෙදෙනාගෙන් එක් අයෙකු සමග කතාබහ කර ඔහු සමග වැඩ කරන අනෙක් කාන්තාව පැමිණ නොතිබූ බැවින්, නොපැමිණීමට හේතු විමසීම සඳහා එම කාන්තාව වෙසෙන නිවස ද ඊට ආසන්නයේම පිහිටා තිබූ බැවින් තමා එම නිවස දෙසට ගමන් කළ බවත්, තමා වෙරළ පසු කොට රේල් පාරට පිවිස දුම්රිය ස්ථානයේ පළමු වේදිකාවේ දකුණු අන්තයේ පිහිටි ගේට්ටුව දෙසට ගමන් කරමින් සිටින විට, සිවිල් ඇඳුමින් සැරසුණු පිරිමි පුද්ගලයන් 04 දෙනෙක් වේදිකාව පැත්තේ රැඳී සිටි බවත්, ඒ අය අතුරින් එක් පුද්ගලයෙකු උස් හඬින් තමාට ඔවුන් සිටි ස්ථානයට පැමිණෙන ලෙස කතා කළ බැවින් තමා ඔවුන් සිටි ස්ථානයට ගිය බව ප්‍රකාශ කර ඇත. තමා එම ස්ථානයට ගිය පසු ඔවුන් තමාගෙන් "තමුසෙ කවුද?, මොනවාද මෙතන කරන්නේ?" යනුවෙන් විමසා සිටි බවත්, ඒවන විට තමා එම පුද්ගලයා කවුරුන්ද යන්න දැන නොසිටි බවත් පසුව දැනගත් පරිදි එසේ තමාට කතා කරනු ලැබුවේ පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියා බවත් ප්‍රකාශ කර ඇත. තවද, මෙම සිදුවීම වන අවස්ථාවේදී තමා ස්වේච්ඡා සංවිධානයේ නිල ටී ෂර්ටය හැඳ සිටි බවත්, එම පුද්ගලයින් තමාගේ හැඳුනුම්පත ඉල්ලා සිටි බැවින් එහිදි තමා විසින් ඔවුන් කවුරුන්දැයි විමසා සිටි බවත්, තමාගේ එම පැනයෙන් කෝපයට පත් වූ එම පුද්ගලයින් ඔවුන්ගේ අනන්‍යතාවය හෙළි කිරීමකින් තොරව තමාගේ හැඳුනුම්පත ඉල්ලා සිටි බවත්, ඒ වනවිටත් තමාගේ හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය ඇතුළු ලේඛන සහිත මුදල් පසුම්බිය නැතිවී තිබූ බැවින් තමා ඒ පිළිබඳව 2024.05.26 වන දින කලුතර දකුණ පොලිසියේ පැමිණිලි කර තිබූ බවත්, ඊට අදාළ සහතික කරන ලද පැමිණිලි පිටපත තමා විසින් මෙම පුද්ගලයන් වෙත ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් ඉන් සෑහීමකට පත් නොවූ එම පුද්ගයන් ඉතා සැර පරුෂ ලෙස හැසිරෙමින් තමා වෙත තදින් බැන වදිමින් තමාගේ හැඳුනුම්පත අවශ්‍ය බව තරයේ කියා සිටි බවත්, තමා රේගු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු පරිපාලන නිලධාරියකු බවත් වසර 05කට වැඩි කාලයක් තිස්සේ රජයේ ආයතන සමග සම්බන්ධව මෙම වෙරළ තීරයේ පරිසර සංරක්ෂණ කටයුතු වල නිරතව සිටින බවත්, මෙදින තමා පැමිණියේ 2024.07.26 දිනට යෙදෙන ලෝක කඩොලාන දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත කඩොලාන පැල සිටුවීමේ වැඩ සහටහනේ මූලික සංවිධාන කටයුතු සඳහා වන බව එම පුද්ගලයින්ට පැහැදිලි කළ බවත්, තවද එම වැඩසටහන පිළිබඳව ලිඛිතව කළුතර පොලිස් ස්ථානාධිපති වෙත ද යොමු කර ඇති බැවින් එමගින් තමාගේ අනන්‍යතාවය තහවුරු කර ගන්නා ලෙස ද ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර ඇත. තමා කොතරම් කරුණු පැහැදිලි කළ ද, ඔවුන් එය පිළිගැනීමට සූදානම් නොවූ බවත් එම පුද්ගලයින් තමාට ඉතාමත් රළු ආකාරයට ආවේගශීලීව බැන බැදුනු බවත්, මෙම සිදුවීම සිදුවූ ස්තානයට තරමක් දුරින් සිටි තවත් පුද්ගලයෙකු එම අවස්ථාවේ පැමිණි බවත්, එම පුද්ගලයාට අනෙක් පිරිස මෙම සිදුවීම පිළිබඳ දැනුවත් කළ බවත්, එවිට එම පුද්ගලයා තමාගේ ටී

ෂර්ටයෙන් ඇදගෙන පාර දෙසට මද දුරක් තමාව රැගෙන විත්, තමාගේ වම් කම්මුල වෙත තදින් පහරක් එල්ල කළ බවත්, තමාට එසේ පහරදීමට හේතුව විමසමින් ඔවුන් කවුරුන්ද යන්න විමසීමේදී, එම පුද්ගලයින් පෙරට වඩා ප්‍රචණ්ඩකාරී ආකාරයට හැසිරුණු බවත් ප්‍රකාශ කර ඇත. තමාගේ කම්මුලට පහරක් ගසනු ලැබූ පුද්ගලයා ඔහුගේ සාක්කුවෙන් යමක් රැගෙන ඔවුන් පොලිසියෙන් බව ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කර ඇත. තමාට එසේ පහරදෙනු ලැබුවේ පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා බව පසුව තමා දැනගත් බවත් මුල් අවස්ථාවේදී ඔවුන් පොලිස් නිලධාරීන් බව තමා නොදැන සිටි බවත් ප්‍රකාශ කර ඇත. පසුව පො. ප. ක්‍රිශාන්ත මහතා විසින් පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියාට තමාට මාංචු දමන ලෙස නියෝග කළ බවත්, එවිට තමා කළ වරද කුමක්දැයි එම නිලධාරීන්ගෙන් විමසා සිටිය ද, ඔවුන් ඊට ප්‍රතිචාරයක් නොදැක්වූ බවත්, පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියා විසින් තමා ඇඳ සිටි ටීෂර්ටයේ කොලරයෙන් ඇදගෙන අනෙක් නිලධාරීන් සමග දුම්රිය ස්ථානයෙන් පිටතට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම මාගේ පුත්‍රයා ත්‍රීරෝද රථයේ සිට බලා සිටි නමුත්, කිසිදු වේලාවක තමා පැමිණියේ සිය පුත්‍රයා සමග බව ප්‍රකාශ නොකළ බවත්, ඊට හේතුව තම පුත්‍රයාට ද කරදරයක් වේවි යැයි තමා බිය වූ බැවින් බව ප්‍රකාශ කර ඇත. පසුව තමාව ත්‍රීරෝද රථයක නංවාගෙන පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා සහ පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියා පොලිස් ස්ථානයට රැගෙන ආ බව සඳහන් කර ඇත. මෙම සිදුවීම එම ස්ථානයේ සිටි බොහෝ පිරිසක් දුටු බවත්, තමා කිසිසේත් අපේක්ෂා නොකළ සිදුවීමකට තමාට මුහුණදීමට සිදුවීම හේතුවෙන් තමා ලැජ්ජාවට හා භීතියට පත්ව සිටි බවත්, තමාව අත්අඩංගුවට ගත් නිලධාරීන් 04 දෙනාම තමාට බැන වැදුනු නමුත් පහරදීමට හා ටී ෂර්ටයේ කොළරයෙන් ඇදගෙන ඒමට පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා සහ පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියා හැර අනෙක් නිලධාරීන් දෙදෙනා සම්බන්ධ නොවූ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තමා පොලිස් ස්ථානයට රැගෙන පැමිණිලි පසු ද, තමා සේවය කරනු ලබන ස්වේච්ඡා සංවිධානය විසින් ලබාදී තිබූ ලිපියේ පිටපත සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමාගෙන් විමසා, තමාගේ අනන්‍යතාවය හෙළිකර ගන්නා ලෙස කොතෙක් කරුණු පැහැදිලි කළ ද එම නිලධාරීන් දිගින් දිගටම තමාට බැන වැදීම සිදුකළා මිනා, තමා ප්‍රකාශ කරන කරුණු තහවුරු කර ගැනීමට උත්සාහ නොකළ බව සඳහන් කර ඇත. පොලිස් ස්ථානය තුළදී තමාගේ ශරීරය පරීක්ෂාවකට ලක් කළද කිසිදු නීති විරෝධී දෙයක් සොයා ගැනිමට එම නිලධාරීන් අසමත් වූ බවත්, පො. සැ.7859 ප්‍රියදර්ශන නිලධාරියා විසින් තමාගේ ඇඟිලි සටහන් ලබාගත් බවත්, එහි සිටි එක් නිලධාරියෙක් පොතක යමක් සටහන් කර තමාට එහි අත්සන් කරන ලෙසට තර්ජනය කළ බවත්, එම අවස්ථාවේදී තමාගේ උපැස් යුවළ තමා සන්තකයේ නොතිබූ බැවින් එහි ලියා තිබූ කරුණු සම්පූර්ණයෙන් මොනවාද යන්න තමාට කියවා ගැනීමට නොහැකි වූ බවත්, තමාට මතක ආකාරයට එහි එක් ස්ථානයක තමා නිකරුනේ වෙරළේ ගැවසුනු බවට හා හැඳුනුම්පත නැති බවට වරද පිළිගන්නා බව එහි සටහන්ව තිබෙනු දුටු බවත් ප්‍රකාශ කර ඇත. නිලධාරියා විසින් ලියා තිබූ ප්‍රකාශය වැරදි බැවින් ඊට අත්සන් කිරීමට තමාට නොහැකි බව තමා ප්‍රකාශ කළ බැවින්, එම නිලධාරියා තමාට බැන වැදී පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා වෙත තමා රැගෙන ගිය බවත්, එහිදී පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා විසින් සැකකරු කියන යමක් තිබේ නම් එය ද නැවත සටහන් කර ගන්නා ලෙස

එම නිලධාරියාට දැනුම්දුන් බවත්, ඒ අනුව එම නිලධාරියා විසින් තමා සඳහන් කළ කරුණු වලින් කොටසක් පමණක් ඔහු ලියා තිබූ ප්‍රකාශයේ අගින් සටහන් කළ බවත්, තමා ලබානොදුන් පෙර ප්‍රකාශය ඉවත් කරන ලෙසට තමා එම නිලධාරියාගෙන් ඉල්ලා සිටි විට එම නිලධාරියා තමාට බැන තර්ජනය කළ බැවින් තමා අත්සන යෙදූ බවත් ප්‍රකාශ කර ඇත. එසේ තමාගෙන් ප්‍රකාශ ලබාගෙන බැන තර්ජනය කර බලෙන් අත්සන ලබාගැනීම සිදුකරනු ලැබුවේ පො. සැ. 54016 ගුණසේකර නිලධාරියා බව පසුව දැනගත් බව ද සඳහන් කර ඇත. තමා අත්අඩංගුවට ගත් 2024.07.21 දින ප.ව 12.15ට ආසන්න වේලාවකදි තමාට ඇප ලබාදී නිදහස් කරන ලද බවත්, ඒවන විට තමා පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා විසින් කම්බුලට පහරදීම හේතුවෙන් දැඩි වේදනාවක් ඇතිව ලැබූ බැවින්, ඇප ලැබුණු පසු කළුතර මහ රෝහට ඇතුළත්වී ප්‍රතිකාර ලබාගත් බවත්, එහිදි ශ්‍රවණ හා අක්ෂි පරික්ෂණයන්ට තමා ලක්කළ බවත්, 2024.07.22 දින රාත්‍රියේ තමා රෝහලේන් මුදා හරින ලද බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් තමාගේ රෝගී තත්ත්වය නැවතත් උත්සන්න වූ බැවින් 2024.07.25 දින සිට 2024.07.29 දින දක්වා කොළඹ ජාතික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනිමට සිදුවූ බවත්, මාගේ වම් කනේ කන්බෙරය සිදුරුවී ඇති බවත් එමගින් තාවකාලික හෝ ස්ථිර දුබලතා ඇතිවිය හැකි බවට වෛද්‍යවරුන් විසින් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. අසාධාරණ ආකාරයට අහේතුකව තමා අත්අඩංගුවට ගෙන පහරදීම හේතුවෙන් තමාට රෝහල්ගත වීමට සිදුවූ බැවින්, 2024.07.27 හා 2024.07.28 යන දෙදින තමා පෙනී සිටිමට නියමිතව තිබූ "ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කුසලතාමත බඳවා ගැනිමේ තරග විභාගයට" පෙනී සිටිමේ අවස්ථාවද අහිමි වූ බව සඳහන් කර ඇත. තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් 2024.08.09 දින පොලිස්පති මහජන සහන මැදිරිය වෙත පැමිණිලි කළ බව සඳහන් කර ඇත.

**පළමුවන වගඋත්තරකරු - පො. ප. ගයාන් ක්‍රිශාන්ත මයා - ස්ථානාධිපති (අපරාධ අංශය)**

පළමුවන වගඋත්තරකරු විසින් 2024.12.13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරික්ෂණයේදී පහත ප්‍රකාශය ලබාදී ඇත. තමා 2024 ජුනි මස සිට කළුතර දකුණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස වැඩ සේවය කරන බවත්, කළුතර වෙරළ තීරයේ විවිධ අපරාධ සිදුවන බැවින් සතියේ දින වල ස්ථානයේ නිලධාරින් ඒ අවට රාජකාරියේ යොදවා ඇති බවත්, සති අන්තයේ දිනවල තමා ද වෙරළ තීරණය අවට නිරීක්ෂණය කිරීම සඳහා යන බවත් සඳහන් කර ඇත. 2024.07.21 වන දින පො. සැ. 66782 ශ්‍රිමාල් නිලධාරියා සමග තමා ද පුද්ගලික යතුරුපැදිවලින් කළුතර දකුණ වෙරළ තීරය පරික්ෂාවට ගිය බවත්, නිල ඇඳුමින් සිටි පො.සැ. 66782 ශ්‍රිමාල් නිලධාරියා දුම්රිය ස්ථානයේ රඳවා පො. සැ. 7859 ප්‍රියදර්ශන, පො. සැ. 54016 ගුණසේකර යන නිලධාරින් සමග තමා වෙරළ තීරය දෙසට ගමන් කළ බවත්, එම අවස්ථාවේදී දුම්රිය පදික වේදිකාව අසල රැදී සිටි පුද්ගලයින් පරික්ෂා කළ බවත්, ඊට ආසන්නයේ කලු පාට ඩෙනිම් කලිසමක් හා අළුපාට ටී ෂර්ට් එකක් ඇඳ ගත් පුද්ගයෙක් වැඩි වේලාවක් ඒ ආසන්නයේ රැදී සිටිනු දුටු බැවින් තමා අනෙක් නිලධාරින්ට ඔහුව පරික්ෂාකරන ලෙසට දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇත. එම

අවස්ථාවේදී සැකකාර පුද්ගලයා ආවේගශීලීව නිලධාරින්ට කතා කරනු තමා දුටු බවත් තමා ද එම ස්ථානයට ගොස් තමාගේ නිල හැඳුනුම්පත පෙන්වා ඔහු කවුරුන්ද යන්න විමසා සිටි බවත් ප්‍රකාශ කර ඇත. තමා අනෙක් නිලධාරින්ට ද ඔවුන්ගේ හැඳුනුම්පත පෙන්වන ලෙස නියෝග කළ බවත් ඉන් පසුද සැකකාර පුද්ගයා ඔහුගේ හැඳුනුම්පත දිම ප්‍රතික්ෂේප කරමින් දිගින් දිගටම ආවේගශීලීව කතා කරමින් හැසුරුණු බවත්, අනන්‍යතාවය තහවුරු කිරිමට කිසිවක් ඉදිරිපත් නොකළ බැවින් පො. සැ. 7859 ප්‍රියදර්ශන නිලධාරියාට සැකකාර පුද්ගලයාට අත්විලංගු යොදන ලෙසට තමා දැනුම්දුන් බවත්, පසුව සැකකරුගේ අතින් අල්ලා ගෙන පාර අයිනට පැමිණ එම ස්ථානයේ තිබු පුද්ගලික ත්‍රිරෝද රථයක් නතර කර එහි නංවාගෙන තමා සහ පො. සැ. 7859 ප්‍රියදර්ශන නිලධාරියා පොලිස් ස්ථානයට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. පොලිස් ස්ථානයට පැමිණ නැවත සැකකරු පරික්ෂා කර බැලිමේදී ද අනන්‍යතාවය තහවුරු කර ගැනිමට නොහැකි වු බැවින් උපසේවක වෙත ඉදිරිපත් කළ බවත් සැකකරුට කිසිදු අවස්ථාවක පහර දිමක් සිදු නොකල බවත් ප්‍රකාශ කර ඇත. තවද ඔහු අත්තඅඩංගුවට ගත් පසු ඔහු සන්තකයේ ඔහුගේ දුරකතනය සහ රුපියල්150/-ක් සහිත මුදල් පසුම්බිය පමණක් තිබු බවත් එදිනම ඔහුට ඇප ලබාදී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන මයා**

දෙවන වගඋත්තරකරු විසින් 2024.12.13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණයේදී පහත ප්‍රකාශය ලබාදී ඇත. කළුතර වෙරළ තිරයේ අපචාර කටයුතු වැඩි වශයෙන් සිදුවන බැවින් කළුතර දකුණ පොලිස් ස්ථානයේ නිලධාරින් ඒ අවට නිරන්තරයෙන් රාජකාරියේ යෙදන බවත්, 2024.07.21 වන දින කළුතර දකුණ වෙරළ තීරය අවට තමා ඇතුළු නිලධාරීන් රාජකාරියේ යෙදී සිටි බවත් ප්‍රකාශ කර ඇත. එදින කළුතර දකුණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වන පො. ප. ගයාන් ක්‍රිෂාන්ත මහතා විසින් තමාට, ලා පාට ටී ෂර්ට් එකකින් සහ නිල් පාට ඩෙනිම් කලිසමකින් සැරසුණු සැකකාර පුද්ගලයෙක් වෙරළ තීරයේ සිටින බවට තොරතුරක් ලැබී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමසිල්ලෙන් සිටින ලෙසට දැනුම්දී තිබූ බව සඳහන් කර ඇත. තමා ඇතුළු නිලධාරීන් අවට පරික්ෂා කරමින් සිටින විට මෙම පැමිණිලිකරු ඉහත සඳහන් කරන ලද ආකාරයේ ඇඳුමකින් සැරසී සිටි බැවින්, තමා ඔහුට කතාකල බවත් ස්ථානාධිපතිතුමා එතුමාගේ හැඳුනුම්පත පෙන්වා අප පොලිස් නිලධාරින් බව ප්‍රකාශ කළ නමුත් සැකකාර පුද්ගලයා එය පිළිගැනිමට සුදානම් නොවු බවත්, තමා විසින් ඔහුගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටියද ඔහු සතුව හැඳුනුම්පත නොතිබු බවත්, ඒ වෙනුවට ඔහු සතුව තිබු කිසියම් කොළ කැබැල්ලක් පෙන්වමින් හැඳුනුම්පත නොමැති බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. තවද, සැකකරුගෙන් ප්‍රශ්න කර සිටින අවස්ථාවේදී සැකකරු පෙන්වූ කොළය පරික්ෂා කිරිමට තමා උත්සාහ නොකළ බවත් එය ඔහුටම තබා ගන්නා ලෙසටම ප්‍රකාශ කළ බවත්, පසුව තමා සහ පො. ප. ගයාන් ක්‍රිෂාන්ත මහතා පුද්ගලික ත්‍රිරෝද රථයකින් සැකකරු ස්ථානයට රැගෙන පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. සැකකරු

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී කිසිදු නිලධාරියෙක් ඔහුට පහර දීමක් සිදු නොකළ බවත් තමා විසින් අත් විලංගු යොදා පොලිස් ස්ථානයට රැගෙන යාම පමණක් සිදුකල බවත් ප්‍රකාශ කර ඇත.

**තුන්වන වගඋත්තරකරු - පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර මයා**

තුන්වන වගඋත්තරකරු 2025.07.29 දින පරීක්ෂණය සඳහා කැඳවා තිබූ නමුත් එදිනට සහභාගී වීමට නොහැකි බව ස්ථානාධිපති (කළුතර දකුණ, පොලිස් ස්ථානය) විසින් ලිඛිතව දැනුම්දී තිබූ බැවින් නැවත 2025.08.21 වන දින කැඳවන ලද අතර, එදින පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. තමා කළුතර දකුණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා සහ පො. සැ. 7859 ප්‍රියදර්ශන සහ පො. කො. 66782 ශ්‍රීමාල් නිලධාරියා සමග කළුතර දකුණ දුම්රියපොළ පිටුපස ද වෙරළ තීරය ද පරික්ෂා කිරීමට උදය වරුවේ පිටත්ව ගිය බවත්, මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී තමා සැකකරු සහ නිලධාරීන් සිටින ස්ථානයට මීටර් 100ක් පමණ දුරින් සිටි බවත්, ස්නාධිපතිතුමා තමාට කතා කර ඔවුන් සිටින ස්ථානයට පැමිණෙන ලෙස ප්‍රකාශ කළ බවත්, තමා එම ස්ථානයට යනවිට පැමිණිලිකරුට අත් මාංචු දමා අත්අඩංගුවට ගෙන තිබූ බවත්, එම ස්ථානයේ ස්ථානාධිපතිතුමා සහ ප්‍රියදර්ශන නිලධාරියා පමණක් සැකකරු සමග සිටි බවත් ප්‍රකාශ කර ඇත. තමා එම ස්ථානයට ගිය පසු සැකකරු පොලිස් ස්ථානයට රැගෙන යමු යැයි ප්‍රකාශ කළ බවත් ඒ අවස්ථාවේ පො. කො. 66782 ශ්‍රීමාල් නිලධාරියා ඔවුන් සිටි ස්ථානයට පැමිණෙමින් සිටිනු තමා දුටු බවත් දුම්රිය ස්ථානයෙන් පිටතට පැමිණි පසු ත්‍රීරෝද රථ ගාලේ නවතා තිබූ ත්‍රීරෝද රථයක සැකකරු නංවාගෙන පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා සහ පො. සැ. 7859 ප්‍රියදර්ශන නිලධාරියා පොලිස් ස්ථානයට ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා හා පො. කො. 66782 ශ්‍රීමාල් නිලධාරියා සම පාගමනින් පොලිස් ස්ථානයට ගිය බවත් ස්ථානයට ගිය පසු පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා තමාට සැකකරුගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස නියෝග කළ බවත්, ඒ අනුව තමා සැකකරුගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත් එහෙත් සැකකරු ප්‍රකාශය අවසානයේ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් තමා එය පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතාට දැනුම් දුන් බවත්, එතුමාගේ විසින් සැකකරු ප්‍රකාශ කරන යමක් තිබේ නම් එයද සටහන් කර ගන්නා ලෙසට නියෝග කළ බැවින් නැවත සැකකරු ප්‍රකාශ කළ දේවල් තමා ලබා ගත් ප්‍රකාශය යටින් සටහන් කළ බවත් සඳහන් කර ඇත. තමා ප්‍රකාශ සටහන් කර ගැනීමේදී සැකකරුට කිසිදු බලපෑමක් නොකළ බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**හතරවන වගඋත්තරකරු - පො. කො. 66782 ටී. කේ. කේ. ශ්‍රීමාල් මයා**

හතතරවන වගඋත්තරකරු 2025.07.29 දින පරීක්ෂණය සඳහා කැඳවා තිබූ නමුත් එදිනට සහභාගී වීමට නොහැකි බව ස්ථානාධිපති (කළුතර දකුණ, පොලිස් ස්ථානය) විසින් ලිඛිතව දැනුම්දී තිබූ බැවින් නැවත 2025.08.21 වන දින කැඳවන ලද අතර, එදින පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. තමා 2024.07.21 වන දින කළුතර දකුණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පො. ප. ගයාන්

ක්‍රිශාන්ත මහතා සහ පො. සැ. 7859 ප්‍රියදර්ශන සහ පො. සැ. 54016 ගුණසේකර නිලධාරියා සමග උදය වරුවේ අපරාධ නිවාරණ රාජකාරී කටයුතු සඳහා කළුතර දකුණ වෙරළ තීරය වෙත පිටත්ව ගිය බවත්, තමා නිල ඇඳුමෙන් සහ අනෙක් නිලධාරින් සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත් ප්‍රකාශ කර ඇත. තමා නිල ඇඳුමින් සැරසී සිටි බැවින් සැකකරුවන් අල්ලා ගැනීම අපහසු විය හැකි බැවින් තමා දුම්රිය ස්ථානයට ඇතුල්වන ස්ථානයේ රැඳී සිටි බවත් අනෙක් නිලධාරින් දුම්රිය ස්ථානයට ඇතුල්වී සෝදිසි කිරීම් සිදුකල බවත් මද වේලාවකට පසු පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා සහ අනෙක් නිළධාරින් දෙදෙනා විසින් සැකකරුවකු මාංචු දමා අල්ලා ගෙන පාරදෙසට රැගෙන එනු තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. ඔවුන් පැමිණි ස්ථානයේම ත්‍රීරෝද රථ නැවතුම්පොලක් තිබු බැවින්, එහි නතර කර තිබු ත්‍රිරෝද රථයකින් පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා සහ පො. සැ. 7859 ප්‍රියදර්ශන නිලධාරියා සැකකරු රැගෙන ගිය බවත්, තමා ඒ ආසන්නයට යාමට පෙර ත්‍රිරෝද රථය පිටත්ව ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා පො. සැ. 54016 ගුණසේකර නිලධාරියා සමග පොලිස් ස්ථානයට ගිය බවත් ස්ථානයට යන විට සැකකරු සිර මැදිරිය අසල පුටුවක වාඩි කර සිටිනු තමා දුටු බවත් ඔහු අත්අඩංගුවට ගැනීමේදී තමා ඊට සම්බන්ධ නොවූ බවත් සැකකරු සමග කිසිදු අවස්ථාවක කතා නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීම :**

පැමිණිලිකරු 2024.07.21 වන දින කළුතර දකුණ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීමේදී, පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා ස්ථානාධිපති (අපරාධ අංශය) විසින් වම් කම්මුලට පහරදුන් බව ප්‍රකාශ කර ඇත. 2024.07.21 දින දහවල් පැමිණිලිකරුට ඇප ලැබී ඇති අතර, එදිනම පැමිණිලිකරු කළුතර මූලික රෝහල වෙත ගොස් ප්‍රතිකාර ලබාගෙන 2024.07.22 දින පිටව ගොස් ඇති බව පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වෛද්‍ය වාර්තාව අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු නැවත වරක් 2024.07.25 වන දින කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් වී 2024.07.29 දින වන තෙක් ප්‍රතිකාර ලබාගෙන ඇත. එහිදී අධිකරණ වෛද්‍ය බී. සී. එම්. රොද්‍රිගෝ මහතා විසින් රෝගියා පරික්ෂා කර පහත පරිදි අධිකරණ වෛද්‍ය වාර්තාවක් නිකුත් කර ඇත.

එකී වෛද්‍ය වාර්තවෙහි අධිකරණ වෛද්‍යවරයා වෙත රෝගියා විසින් ලබාදෙන ලද කෙටි රෝග ඉතිහාසය තුළ රෝගියා පහත ප්‍රකාශය ලබාදී ඇත. "තමා 2024.07.21 දින උදෑසන 10.00 ට පමණ කළුතර දකුණ දුම්රිය පළේ දකුණු අන්තයේ ස්වේච්ඡා සංවිධානයේ රාජකාරි කටයුත්තක් සඳහා ගොස් සිටියදී, පුද්ගලයින් හතර දෙනෙක් තමාගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටි බවත්, හැඳුනුම්පත නැතිවී තිබූ බැවින් ඒ සඳහා ගොනුකරන ලද පැමිණිල්ලේ පිටපත ඔවුන්ට ලබාදුන් පසු එය භාර නොගෙන බැන වැදුනු බවත්, තමා විසින් ඔවුන් කවුරුන්දැයි විමසුවිට එහි ප්‍රධානියා ලෙස සිටි පුද්ගලයා තමාගේ ටී ෂර්ටයෙන් ඇද බිත්තිය පැත්තට හරවා වම් කම්මුලට පහරක් ගැසූ බවත්, ඉන්පසු ඔවුන් පොලිසියෙන් යැයි යමක් පෙන්වා තමාට මාංචු දමා පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණි බවත්, එදින තමාට ඇප

ලැබුණු පසු කළුතර රෝහල වෙත ගොස් ප්‍රතිකාර ලබාගත් බවත්, පහරදීම හේතුවෙන් කන තුළින් ශබ්දයක් දැනීම හේතුවෙන් ජාතික රෝහලට පැමිණි බවත්" ප්‍රකාශ කර ඇත.

මෙම අධිකරණ වෛද්‍ය වාර්තාව නිරීක්ෂණය කිරීමේදී, පැමිණිලිකරු 2024.07.25 වන දින ජාතික රෝහලට ඇතුළත්වී 2024.07.29 දින දක්වා ප්‍රතිකාර ලබාගෙන ඇති බව තහවුරු වේ.

- වාර්තාවෙහි තුවාලයේ ස්වභාවය යන්නෙහි, "උගුර, කන, නාසය පිළිබඳ වෛද්‍යවරයාගේ මතයට අනුව වම් කනේ, කණ් බෙරයෙහි (පටහ පටලයෙහි) කුඩා සිදුරක් තිබුණි." (According to the ENT opinion there was a small perforation on the tympanic membrane of the left ear.) වශයෙන් සටහන් කර ඇත.

- එමෙන්ම, කළුතර ශික්ෂණ රෝහලේ රෝග විනිශ්චය කාඩ්පතට අනුව, රෝගියා 2024.07.21 දින ඇතුළත් කර ඇති අතර 2024.07.22 දින රෝහලෙන් නිදහස් කර ඇති බවත්, එම අවස්ථාවේදී කනේ කන්කලාදුරු පැවතීම හේතුවෙන් වම් කණේ පටහ පටලය කොටස දෘශ්‍යමාන වී නොමැති බවට සටහන් යොදා ඇති බව සඳහන් කර ඇත. (According to the discharge card teaching hospital kaluthara, examinee was admitted 21.07.2024 and was discharged on 22.07.2024 at that time, the left tympanic membrane could not be visualized due to the presence of ear wax.)

- තවද, කොළඹ ජාතික රෝහලේ රෝග නිශ්චය කාඩ්පත සහ ප්‍රධාන වෛද්‍යවරයාගේ සහ උගුර, කන, නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයාගේ මතය අනුව, 2024.07.26 දින සිදු කරන ලද පරීක්ෂණය අනුව, වම් කණෙහි පටහ පටලයේ කුඩා සිදුරුවීමක් සිදුවී ඇති අතර, වම් පැත්තේ සුළු සන්නායක ශ්‍රවණාබාධයක් ඇති වී තිබෙන බව සඳහන් කර ඇත. (According to Colombo national hospital bed head ticket and opinion of the consultant ENT surgeon, there was a small perforation of the left ear tympanic membrane and there was a mild left side conductive hearing loss according to the pure tone audiometry done on 2024.07.26.)

- 2024.08.15 දින පරීක්ෂකවරයා සමාලෝචනය කරන ලද අතර, ඔහුගේ රෝග ලක්ෂණ යහපත් අතට හැරී ඇති බවත්, එදිනෙදා කටයුතු කරගෙන යන බවත් සඳහන් කර ඇත. (Examinee was reviewed on 15.08.2024 he indicated his symptoms have improved and continuing day – to – day activities.)

ඉහත දක්වන ලද අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව, පැමිණිලිකරු 2024.07.21 වන දින අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඔහුට පහරදීමක් සිදුවූ බැවින් 2024.07.22 කළුතර ශික්ෂණ රෝහලට ඇතුළත්වී ඇති බවත්, එදින වෛද්‍යවරයා විසින් සිදුකරන පරීක්ෂා කළද, වම් කණේ පටහ පටලය කොටස

දෘශ්‍යමාන වී නොමැති බැවින් කන්බෙරයට හානියක් සිදුවී තිබේද යන්න නිශ්චය කර ගැනීමට නොහැකි වී ඇති බවත් පෙනීයයි. නැවතත් රෝගී තත්ත්වය උත්සන්නවීම මත පැමිණිලිකරු 2024.07.25 වන දින ජාතික රෝහලට ඇතුළත්වී ප්‍රතිකාර ලබාගෙන ඇති අතර එහිදී උගුර, කන, නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයා විසින් සිදුකරන ලද පරීක්ෂණ අනුව, වම් කණෙහි පටහ පටලයේ කුඩා සිදුරුවීමක් සිදුවී ඇති බවත්, වම් පැත්තේ සුළු ශ්‍රවණාබාධයක් ඇති වී බවත් නිගමනය කර තිබේ. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා ස්ථානාධිපති (අපරාධ අංශය) විසින් වම් කම්මුලට සිදුකරන ලද පහරදීම හේතුවෙන් මෙකී ශ්‍රවණාබාධිත තත්ත්වයට පැමිණිලිකරු පත්වූ බවත් මේවන විට සුවය ලබාදී ඇති බවත් වෛද්‍ය වාර්තා අනුව තහවුරු වේ.

2024.07.21 වන දින පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට හේතුව වශයෙන් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, "අනන්‍යතාවය තහවුරු කිරීමට කිසිදු ලියවිල්ලක් නොමැති බැවින් සැකපිට" අත්අඩංගුවට ගත් බවයි. එහෙත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, සිවිල් ඇඳුමින් සැරසුණු පිරිමි පුද්ගලයන් 04 දෙනෙක් තමාට පරුෂ වචනයෙන් බැන වදිමින් තමාගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටි බවත්, ඒ වනවිටත් තමාගේ හැඳුණුම්පත, රියදුරු බලපත්‍රය ඇතුළු ලේඛන සහිත මුදල් පසුම්බිය නැතිවී තිබූ බැවින් ඔහු විසින් 2024.05.26 වන දින කළුතර දකුණ පොලිසියේ පැමිණිලි කර තිබූ බවත්, ඊට අදාළ සහතික කරන ලද පැමිණිලි පිටපත ඔහු එම පුද්ගලයන් වෙත ඉදිරිපත් කළ ද ඔවුන් ඉන් සෑහීමකට පත් නොවූ බවත් ය. පැමිණිලිකරු විසින් 2024.05.26 දින 85/158 දරණ අංක යටතේ ඉහත පැමිණිල්ල යොමුකර තිබූ බව තහවුරු කිරීම සඳහා එකී පැමිණිල්ලේ පිටපතක් කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සතුව ඔහුගේ ජාතික හැඳුනුම්පත නොතිබුණ ද, එය නැති වූ බව තහවුරු කිරීම සඳහා එම පොලිස් ස්ථානයේම ගොනුකරන ලද පැමිණිලි පිටපතක් ඔහු සන්තකයේ තිබී ඇති බව පෙනීයයි.

පැමිණිලිකරු සිය අනන්‍යතාවය තහවුරු කිරීමට කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් නොකළ බවට පළමුවන වගඋත්තරකරුවන පො. ප. ගයාන් ක්‍රිශාන්ත මයා (ස්ථානාධිපති -අපරාධ අංශය) කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කළ ද එම නිලධාරියා සමගම එදින රාජකාරියේ යෙදී සිටි දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "තමා විසින් සැකකරුගෙන් හැඳුණුම්පත ඉල්ලා සිටියද ඔහු සතුව හැඳුණුම්පත නොතිබූ බවත්, ඒ වෙනුවට ඔහු සතුව තිබූ කිසියම් කොළ කැබැල්ලක් පෙන්වමින් හැඳුණුම්පත නොමැති බව ප්‍රකාශ කළ බවත්, සැකකරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු පෙන්වූ කොළය පරීක්ෂා කිරීමට තමා උත්සාහ නොකළ බවත්, එය ඔහුටම තබා ගන්නා ලෙසටම ප්‍රකාශ කළ බවත්" ය. ඒ අනුව නිරීක්ෂණය වන්නේ පැමිණිලිකරු ප්‍රකාශ කළ ආකාරයට ඔහුගේ හැඳුනුම්පත ඇතුළු මුදල් පසුම්බිය නැතිවී තිබීම සම්බන්ධයෙන් දමන ලද පැමිණිල්ලේ පිටපතක් පැමිණිලිකරු සතුව තිබී ඇති බවත්, එය පොලිස් නිලධාරීන්ට පෙන්නුව ද පොලිස් නිලධාරීන් විසින් එකී ලියවිලල් පරීක්ෂා කර නොමැති බවයි.

නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ රාජකාරී කටයුතුවල නිරතවන පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සැකකටයුතු පුද්ගලයෙකු පරික්ෂා කිරීමේදී ඔහුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම කළයුතු අතර, එහිදී ජාතික හැඳුනුම්පත පුද්ගලයෙකු සතුව නොතිබීම මතම ඔහු සැකකටයුතු පුද්ගලයෙකු යැයි තහවුරු කරගැනීම ගැටලුසහගත වන බව පෙනීයයි. මෙම අත්අඩංගුවට ගැනීමේදී ද සිදුව ඇත්තේ එවැනි තත්ත්වයකි. පැමිණිලිකරු සතුව ජාතික හැඳුනුම්පත නොතිබුණ ද එය තහවුරු කිරීම සඳහා තිබූ පොලිස් පැමිණිල්ල පරික්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමකි. එහෙත් මෙම නිලධාරීන් එකී වගකීම නොසලකා හැර අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කළ ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

විශේෂයෙන් දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා වෙත අදාළ පැමිණිලි පිටපත ලබාදුන් අවස්ථාවේදී ඔහු එය බැලීම ප්‍රතික්ෂේප කිරීම සහ වැටලීම් ප්‍රධානියා වශයෙන් කටයුතු කළ පො. ප. ගයාන් ක්‍රිශාන්ත මයා (ස්ථානාධිපති -අපරාධ අංශය) වෙත හෝ දැනුම්නොදීම යන ක්‍රියාකලාපයන් තුළින් පැහැදිලි වන්නේ පොලිස් නිලධාරියෙකු වශයනේ දෙවන වගඋත්තරකරු මෙම අවස්ථාවේදී සිය බලය අත්තනෝමතික ලෙස භාවිතා කර ඇති බවයි.

තවද, දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතාට සැකකාර පුද්ගලයෙක් වෙරළ තීරයේ සිටින බවට තොරතුරක් ලැබී තිබූ බවත්, තොරතුරේ සඳහන් පරිදි එකී පුද්ගලයා, ලා පාට ටී ෂර්ට් එකකින් සහ නිල් පාට ඩෙනිම් කලිසමකින් සැරසී සිටින බව සඳහන් කර තිබූ බවත්, එවැනි පුද්ගලයෙකු දුටුවහොත් දැනුම්දෙන ලෙසට පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා තමාට දැනුම්දී තිබූ බැවින් ඒ පිළිබඳව සෝදිසියෙන් සිටින අවස්ථාවේදී, මෙම පැමිණිලිකරු ඉහත සඳහන් කරන ලද ආකාරයේ ඇඳුමකින් සැරසී සිටි බැවින්, තමා ඔහුට කතාකල බවට කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. ඒ අනුව පෙනීයන්නේ, පොලිස් නිලධාරීන්ට කිසියම් සැකකරුවෙකු පිළිබඳව තොරතුරක් ඒවන විටත් ලැබී තිබී ඇති බවත්, එකී තොරතුර අනුව එම සැකකරු මෙම පැමිණිලිකරු යැයි සිතා ඔහුව පරික්ෂා කර අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවයි. එහෙත් මෙම අත්අඩංගුවට ගැනීම සිදු කිරීමේදී නිලධාරීන් ක්‍රියාකර ඇති ආකාරය අනුව සාධාරණ විමර්ශනයක් සිදු කිරීමකින් තොරව සිදුකරන ලද අත්අඩංගුවට ගැනීමක් බව නිරීක්ෂණය වේ.

තවද, දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා විසින් ලබාදුන් උපදෙස් අනුව සිදුකරන ලද සෝදිසි කිරීමකදී මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුකළ බවයි. එහෙත් ඒ සම්බන්ධයෙන් පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "තමා ඇතුළු නිලධාරීන් විසින් දුම්රිය පදික වේදිකාව අසල රැදි සිටි පුද්ගලයින් පරික්ෂාවට ලක් කළ බවත්, ඊට ආසන්නයේ කලු පාට ඩෙනිම් කලිසමක් හා අළුපාට ටී ෂර්ට් එකක් ඇද ගත් පුද්ගයෙක් වැඩි වේලාවක් ඒ ආසන්නයේ රැදි සිටිනු දුටු බැවින් තමා අනෙක් නිලධාරින්ට ඔහුව පරික්ෂා කරන ලෙසට දැනුම්දුන් බවයි". ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පළමුවන වගඋත්තරකරු සහ දෙවන වගඋත්තරකරු විසින්

මානව හිමිකම් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශ එකිනෙකට පරස්පර විරෝදී බව පෙනීයයි. එබැවින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිලධාරීන් ක්‍රියා කර ඇති ආකාරය ගැටලු සහගත බව පෙනීයයි.

තවද, දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා විසින් සඳහන් කරන ලද ඉහත ඔත්තුව සම්බන්ධයෙන් පළමුවන වගඋත්තරකරුවන පො. ප. ගයාන් ක්‍රිෂාන්ත මහතා කිසිදු කරුණු දැක්වීමක් කොමිෂන් සභාව වෙත සිදුකර නොමැති අතර, තුන්වන හා හතරවන වගඋත්තරකරු වන් විසින් ද එවැනි තොරතුරක් ලැබී තිබූ බවට දැනුවත්ව සිටි බව ප්‍රකාශ කර නොමැත. ඒ අනුව මෙම නිලධාරීන් විසින් ලබාදී ඇති ප්‍රකාශයන් ද එකිනෙකට පරස්පර විරෝධී බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ල සනාථ කිරීම සඳහා පැමිණිලිකරු විසින් 2024.07.21 වන දින ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඇසින්දුටු සාක්ෂිකරුවෙකු ලෙස ඔහුගේ පුත්‍රයා විසින්, සිවිල් පුද්ගලියන් 04 දෙනෙකු විසින් පියාට වම් කම්මුලට පහරදී, පරුෂ වචනයෙන් බැන වදිමින්, මාංචු දමා ත්‍රීරෝදරථයක නංවාගෙ රැගෙන යනු ඇසින්දුටු බවත්, එම සිදුවීම සිය මවට දුරකථනයෙන් දැනුම්දුන් බවත් දිව්රුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත යොමුකර තිබේ. අධිකරණ වෛද්‍ය වාර්තාව සහ ඉහත ඇසින්දුටු සාක්ෂිය අනුව පැමිණිලිකරුට පහරදීමක් සිදුවී ඇති බව තහවුරු වේ.

එමෙන්ම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ගෙන ගිය පසු ඔහුගෙන් ප්‍රකාශ ලබාගැනීම උ. පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියාගේ නියෝග පරිදි තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියා විසින් සිදුකර ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කර ඇති ආකාරයට ඔහුගෙන් ප්‍රකාශ ලබාගැනීමේදී තුන්වන වගඋත්තරකරු විසින් ඔහුගේ අභිමතය පරිදි ප්‍රකාශයක් සටහන් කර ඊට පැමිණිලිකරුට අත්සන තබන ලෙස තර්ජනය කළ කර ඇති අතර, පැමිණිලිකරු ප්‍රතික්ෂේප කිරීමෙන් පසු එම නිලධාරියා පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා වෙත පැමිණිලිකරු යොමුකර ඇති අතර, එහිදී පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා පැමිණිලිකරුට බැනවැදී පසුව තුන්වන වගඋත්තරකරු වන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර මහතාට පැමිණිලිකරු ප්‍රකාශ කරන යමක් තිබේ නම් එය ද සටහන් කර ගන්නා ලෙස නියෝග කර ඇත. එකී නියෝග අනුව පැමිණිලිකරු ප්‍රකාශ කළ සියලු කරුණු සටහන් නොකර නැවත වරක් තර්ජනය කරමින් අත්සන ලබාගත් බවට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමේදී ඇති වූ ගැටලුකාරී තත්ත්වය පිළිබඳව තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියාගෙන් කොමිෂන් සභාව විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, "පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතා තමාට සැකකරුගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස නියෝග කළ බවත්, ඒ අනුව තමා සැකකරුගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත් එහෙත් සැකකරු ප්‍රකාශය අවසානයේ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් තමා එය පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතාට දැනුම් දුන් බවත්, එතුමාගේ විසින් සැකකරු ප්‍රකාශ කරන යමක් තිබේ නම් එයද සටහන් කර ගන්නා ලෙසට නියෝග කළ බැවින් නැවත සැකකරු ප්‍රකාශ කළ දේවල් තමා ලබා ගත්

ප්‍රකාශය යටින් සටහන් කළ බවත්, තමා ප්‍රකාශ සටහන් කර ගැනීමේදී සැකකරුට කිසිදු බලපෑමක් නොකළ බවත්'' ය.

කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුගෙන් ලබාගන්නා ලද ප්‍රකාශ සටහන් සහිත උද්‍ධෘත ගොනුවෙහි, පැය 10.52 ට පිටුව 10 ඡේදය 190 හි සටහන් කර ඇති සැකකරුගේ ප්‍රකාශය නිරීක්ෂණය කිරීමේදී, සැකකරුගේ ප්‍රකාශය සටහන් කර අවසානයේ, "මට කීමට ඇත්තේ එපමණයි. කියවා තේරුම් කර දුන්නා, නිවැරදි බවට පිළිගෙන අත්සන් කළා." වශයෙන් සඳහන් කොට පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියාගේ අත්සන ද යෙදීමෙන් අනතුරුව, නැවත ප්‍රකාශයක් සටහන් කර ඇත. එකී ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, "මම වෙරළ තීරයට තනියෙන් ආවෙ. ජූලි මස 26 වනදා ලෝක කඩොලාන දිනය වෙනුවෙන් කළුතර ප්‍රාදේශීය ලේකම්තුමා, කළුතර දකුන පොලිස් ස්ථානයේ පරිසර අංශයේ නිලධාරීන් සමග මූලික කටයුතු කර මේ පිළිබඳව සොයාබලා ගැනීම සඳහා පැමිණියා'' යනුවෙන් පමණි. එම ප්‍රකාශයෙන් පසුව, "මට කීමට ඇත්තේ එපමණයි. කියවා තේරුම් කර දුන්නා, නිවැරදි බවට පිළිගෙන අත්සන් කළා." වශයෙන් සඳහන් කොට පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියාගේ අත්සන යොදා ඇත. ඊටත් පසු තුන්වර වරටත් ප්‍රකාශයක් සටහන් කර ඇත. එකී ප්‍රකාශයෙහි, "තවද මාගේ අනන්‍යතාවය තහවුරු කිරීමට හැඳුනුම්පතක් හෝ වෙනත් ලියවිල්ලක් මා සතුව තිබුනේ නැති බවට වරද පිළිගෙන අත්සන් කළා'' යනුවෙන් සටහන් කර ඇත.

සැකකරුවෙකුගේ ස්වාධීන ප්‍රකාශයක් ලබාගන්නා අවස්ථාවකදී ප්‍රකාහයේ තැනින් තැන "මට කීමට ඇත්තේ එපමණයි. කියවා තේරුම් කර දුන්නා, නිවැරදි බවට පිළිගෙන අත්සන් කළා." වශයෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. එහෙත් මෙම ප්‍රකාශය තුළ කෙටි ප්‍රකාශ තුනක් සටහන් කර ඇති අතර, එකී අවස්ථා තුන තුළදීම ඉහත පරිදි සටහන් කර නිලධාරියාගේ විස්තර ද සටහන් කර ඇත. එය ගැටලු සහගත වේ. පැමිණිලිකරුගේ ස්වාධීන ප්‍රකාශයක් ලබාගත්තේ නම් එකවර ප්‍රකාශය ලබාගෙන ඊට අත්සන ලබාගැනීම සිදුකළ යුතුව තිබූ නමුත්, මෙම ප්‍රකාශ සටහන විමර්ශනය කිරීමේදී වරින්වර වෙනස් කරමින් ලියන ලද ප්‍රකාශය කිහිපයක් දැකගත හැකි අතර, අවස්ථා තුනක ප්‍රකාශය අවසන්කර නැවත නැවත ලියා ඇති බව නිරීක්ෂණය වේ.

මේ සම්බන්ධයෙන් තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියාගෙන් විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු පළමු ප්‍රකාශයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ බැවින්, පො. ප. ගයාන් ක්‍රිශාන්ත මහතාගේ උපදෙස්මත පැමිණිලිකරු වරින්වර ප්‍රකාශ කළ ප්‍රකාශ නැවත නැවත සටහන් කළ බවයි. කෙසේනමුත් පැමිණිකරුගෙන් ලබාගත් බවට සඳහන් එකී ප්‍රකාශ ස්වාධීන ප්‍රකාශක් ද යන්න ගැටලු සහගත වන බව කොමිෂන් සභාවට පෙනීයයි.

පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සිවිල් ඇඳුමින් නිලධාරීන් 04 දෙනෙකු සිටි බවට පැමිණිලිකරු සඳහන් කර ඇති නමුත්, හතරවන වගඋත්තරකරුවන පො. කො. 66782 ටී. කේ. කේ. ශ්‍රීමාල් නිලධාරියා එදින එම ස්ථානයේ නොසිටි බවත්, වෙනත් නිලධාරියෙකු සිවිල් ඇඳුමින් සිටි බවත් ය. එහෙත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බිනධයෙන් කළුතර දකුණ පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොත්වල සටහන් කර ඇත්තේ පො. කො. 66782 ටී. කේ. කේ. ශ්‍රීමාල්

නිලධාරියාගේ නම වේ. මේ සම්බන්ධයෙන් හතරවන වගඋත්තරකරුගෙන් විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, තමා එදින නිල ඇඳුමෙන් සැරසී සිටි බැවින් අනෙක් නිලධාරීන් තිදෙනාට තරමක් දුරින් සිටි බවත්, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී එම ස්ථානයේ තමා නොසිටි බවත්, පො. ප. ගයාන් ක්‍රිශාන්ත නිලධාරියා සහ පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියා විසින් සැකකරු ත්‍රීරෝද රථයක නංවාගෙන යනු පමණක් තමා දුටු බව ප්‍රකාශ කර ඇත.

කෙසේනමුත් හතරවන සැකකරු විසින් තමාට බැන වැදීම, පහරදීම හෝ අත්අඩංගුවට ගැනීම සිදුනොකළ බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇති බැවින් මෙම පැමිණිල්ලේ විෂයගත සිදුවීම සම්බන්ධයෙන් හතරවන වගඋත්තරකරු වන පො. කො. 66782 ටී. කේ. කේ. ශ්‍රීමාල් නිලධාරියා වගකීමට යටත් නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද, පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තතේ, තමා අසාධාරණ ආකාරයට අහේතුකව අත්අඩංගුවට ගෙන පහරදීම හේතුවෙන් තමාට රෝහල්ගත වීමට සිදුවූ බැවින්, 2024.07.27 හා 2024.07.28 යන දෙදින තමා පෙනී සිටිමට නියමිතව තිබූ "ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කුසලතාමත බඳවා ගැනිමේ තරග විභාගයට" පෙනී සිටිමේ අවස්ථාවද අහිමි වූ බවයි. එකී තරග විභාගයට පැමිණිලිකරුට පෙනී සිටීමට තිබූ බව තහවුරු කිරීම සඳහා විභාග අයදුම්පතෙහි ඡායා පිටපත් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර, 2024.07.25 වන දින ජාතික රෝහලට ඇතුළත්වී 2024.07.29 දින දක්වා ප්‍රතිකාර ලබාගෙන ඇති බව වෛද්‍ය වාර්තාව නිරීක්ෂණය කිරීමේදී සනාථ වේ. ඒ අනුව ඉහත දක්වන ලද දෙදින සහභාගීවීමට නියමිතව තිබූ විභාගයට මුහුණදීමේ අවස්ථාව පැමිණිලිකරුට අහිමිවී ගොස් ඇත්තේ පැමිණිලිකරුගේ දෝෂයකින් නොවන බවත්, රාජ්‍ය නිලධාරීන් වශයෙන් කළුතර දකුණ පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් හේතුවෙන් බව පෙනීයයි.

පැමිණිලිකරු විසින් කළුතර දකුණ පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපය සම්බන්ධයෙන් 2024.08.09 වන දින පොලිස් මූලස්ථානයේ මහජන සහන මැදිරිය වෙත CIB(I) 224/36 දරණ පැමිණිලි අංක යටතේ පැමිණිල්ලක් සිදුකර ඇති අතර, එකී පැමිණිල්ල සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 2026.03.17 දිනැති ලිපිය මගින් පොලිස් මූලස්ථානය වෙතින් විමසීමක් සිදුකරන ලදි. ඊට පිළිතුරු ලෙස 2026.04.08 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් විශේෂ විමර්ශන ඒකකය විසින් ලිපියක් යොමුකරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු වන ඩබ්. ප්‍රේමරත්න යන අයට කළුතර දුම්රිය ස්ථානය අසලදී කළුතර දකුණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පො. ප. ගයාන් ක්‍රිශාන්ත, පො. සැ. 7859 ප්‍රියදර්ශන, පො. සැ. 54016 ගුණසේකර, පො. කො. 66782 ශ්‍රීමාල් යන නිලධාරීන් විසින් සිදුකරන ලද පහරදීම සම්බන්ධයෙන් වූ මූලික විමර්ශන ආරම්භ කර ඇති බවයි.

**නිගමනය**

පොලිස් නිලධාරීන්ට කිසියම් පුද්ගලයෙකු පාරේ සිටි පමණින් හෝ හැඳුනුම්පතක් නොමැති වූ පමණින් "සැකකරුවෙකු" ලෙස නම් කර අත්අඩංගුවට ගත නොහැකි බවත්, පුද්ගල නිදහස සුරැකීම නීතිය ක්‍රියාත්මක කිරීමට වඩා ඉහළින් පවතින බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු තීන්දු ගණනාවක් මගින් තහවුරු කර තිබේ.

SC FR 129/2007 දරණ කුෂාන් ඉන්දික එදිරිව විජේසේකර සහ අනෙකුත් අය දරණ නඩු තීන්දුව ඒ සඳහා උදාහරණයකි. මෙකී නඩුවෙහි පෙත්සම්කරු වූ කුෂාන් ඉන්දික රාජ්‍ය වැවිලි සංස්ථාවේ රියදුරෙකු ලෙස සේවය කළ අයෙක් වන අතර, ඔහු නිවාඩු ලබා නිවසට පැමිණ නැවත සේවයට වාර්තා කිරීම සඳහා කොළඹ බලා යාමට ගාල්ල, ගල්ඉන්ද මංසන්දියේ බස් රථයක් එනතුරු රැඳී සිටින අවස්ථාවේදී, එම ස්ථානයෙන් ගමන් කළ පිටිගල පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු පිරිසක් ඔහුව ප්‍රශ්න කර ඇති අතර, එහිදී පෙත්සම්කරුට තම අනන්‍යතාවය තහවුරු කිරීමට (හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට) නොහැකිවී ඇත. පසුව පොලිසිය විසින් ඔහුව අත්අඩංගුවට ගෙන, පොලිස් රථයට දමාගෙන ගොස් සිර මැදිරියේ රඳවා තබා ඇති අතර, පසුව හිතවතෙකු පැමිණ ඔහු රජයේ සේවකයෙකු බවට තහවුරු කිරීමෙන් පසු පොලිසිය විසින් ඔහුව මුදා හැර තිබේ. මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි බණ්ඩාරනායක මහත්මිය ඇතුළු විනිසුරු මඩුල්ල විසින් අවධාරණය කර ඇත්තේ, 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව සෑම පුරවැසියෙකුම හැඳුනුම්පතක් ළඟ තබා ගත යුතු වුවද, යම් පුද්ගලයෙකු සතුව එම අවස්ථාවේදී හැඳුනුම්පත නොමැති වීම පමණක්ම ඔහුව අත්අඩංගුවට ගැනීමට නීතිමය පදනමක් නොවන බවයි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම තීන්දුව ලබාදීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, පොලිස් නිලධාරීන් විසින් තම නීතිමය බලතල අත්තනෝමතික ලෙස සහ සාධාරණ හේතුවකින් තොරව භාවිත කරමින් පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබීමයි.

තවද, SC FR 177/2005 දරණ අංක යටතේ ගොනු කළ තිලකරත්න එදිරිව ලියනගේ සහ අනෙකුත් අය දරණ නඩු තීන්දුව මගින් ද එය තවදුරටත් තහවුරු කර ඇත. මෙම නඩුවේ පෙත්සම්කරු වූ තිලකරත්න මහතා සාමකාමීව පොදු ස්ථානයක රැඳී සිටියදී, එහිදී සිදුවූ හදිසි පොලිස් සෝදිසියකදී ඔහුගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටි අතර, අමතක වීමකින් ඔහු හැඳුනුම්පත රැගෙනවිත් නොතිබූ බැවින් එම අවස්ථාවේදී හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇති අතර, තමන් අසල පිහිටි ආයතනයක සේවය කරන බවත්, එහි ගොස් අනන්‍යතාවය තහවුරු කළ හැකි බව පැවසුවද, පොලිසිය ඊට ඉඩ නොදී ඔහුව "අනන්‍යතාවය පිළිබඳ සැක සහිත පුද්ගලයෙකු" ලෙස සලකා අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව පුද්ගලයෙකු පවසන තොරතුරු (නම, ලිපිනය හෝ රැකියා ස්ථානය) පිළිබඳව විමර්ශනය කර බැලීමට මූලික පියවර නොගෙන, හුදෙක් අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි වූ සැනින් අත්අඩංගුවට ගැනීම නීති විරෝධී සහ අත්තනෝමතික ක්‍රියාවක් බව සඳහන් කරමින් පොලිස් නිලධාරීන්ගේ මෙම ක්‍රියාව මගින් පෙත්සම්කරුගේ 13(1) සහ 13(2)

වගන්ති යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවී ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුකර ඇත.

එමෙන්ම SC FR 582/1997 (එදිරිසිංහ එදිරිව සේනානායක සහ අනෙකුත් අය) දරණ නඩු තීන්දුව ඇතුළු තවත් ඒ හා සමාන නඩු තීන්දු මගින්, වාරණයක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට නම්, ඔහු කිසියම් වරදකට සෘජුවම සම්බන්ධ බවට ස්ථිර සහ සාධාරණ හේතු තිබිය යුතු මිස, හුදෙක් හැඳුනුම්පත නොමැති වීම යන කරුණ ඒ සඳහා පාවිච්චි කළ නොහැකි බවත්, හැඳුනුම්පතක් ළඟ නොමැති වීම හෝ අනන්‍යතාවය එම අවස්ථාවේදී තහවුරු කිරීමට නොහැකි වීම අපරාධයක් නොවන බවත් අවධාරණය කර තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල හා සාක්ෂි, වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු, අධිකරණ වෛද්‍ය වාර්තාව ඇතුළු සියලුම කරුණු විමර්ශන කිරීමෙන් පසු, පැමිණිලිකරු වන ඩබ්. ප්‍රේමරත්න මහතා 2024.07.21 වන දින කළුතර දකුණ දුම්රිය ස්ථානයේ දුම්රිය වේදිකාවේ ගමන් කරමින් සිටියදී, සිවිල් ඇඳුමින් සැරසී සිටි පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන සහ තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. වගඋත්තර පාර්ශවය වෙත පැමිණිලිකරු සිය හැඳුනුම්පත නැතිවූ බව තහවුරු කිරීම සඳහා පැමිණිල්ලේ පිටපතක් නිලධාරීන්ට ඉදිරිපත් කර තිබියදීත්, එකී ලේඛන නිසි පරීක්ෂණයකට ලක් නොකර අනන්‍යතාවය තහවුරු කළ නොහැකි වූ බවට ව්‍යාජ චෝදනාවක් ඉදිරිපත් කරමින් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත. ඒ අනුව ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් තිදෙනා විසින් සිය රාජකාරිය අත්තනෝමතික ආකාරයෙන් සිදුකරමින්, නිසි විමර්ශනයකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවට සහ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරුට පහරදීමක් ද සිදුකර ඇති බවත්, පොලිස් ස්ථානයට රැගෙන ගොස් ප්‍රකාශ සටහන් කිරීමේදී පැමිණිලිකරුට ස්වාධීන ප්‍රකාශයක් ලබාදීමට අවස්ථාව ලබානොදී අත්තනෝමතික ආකාරයට කටයුතු කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පොලිස් නිලධාරීන් විසින් නිසි විමර්ශනයකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බැවින් **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති "නීතියේ නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතුතේය" යන මූලික අයිතිවාසිකම, පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන, තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

නීත්‍යානුකූල ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කිසියම් සැකකරුවෙකු අත්අඩංගුවට ගත්පසු පැය 24 ක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් කිරීම හෝ ඇප මත මුදාහැරීම සිදු කළ යුතුය. එහෙත් නීත්‍යානුකූල රාමුවෙන් පරිබාහිරව කිසියම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබේ නම්, එවැනි අවස්ථාවකදී එම පුද්ගලයා සුළු වේලාවක් හෝ රඳවා ගැනීම තුළින් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදුවේ.

මෙකී සිදුවීමේදී ද මෙම පැමිණිලිකරු පැය 09.50 ට පමණ අත්අඩංගුවට ගෙන සිර මැදිරියේ රඳවා තබා පැය. 12.05 පමණ ඇප ලබාදී ඇත. පැමිණිලිකරු ඇප මත මුදා හැරීම සිදු කළ ද, ඔහු අත්අඩංගුවට ගත් ආකාරය නීත්‍යානුකූල නොවන බැවින් ඔහු රඳවා තබාගැනීම ද නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය වේ. එබැවින් **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13 (2) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය." යන මූලික අයිතිවාසිකම, පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන, තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

අත්අඩංගුවට ගැනීමේදී නීතිය ප්‍රකාරව සිදු කළ යුතු නිසි විමර්ශනයක් සිදු කිරීමකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම මගින් **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම, පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), දෙවන වගඋත්තරකරුවන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන, තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

තවද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය) යන නිලධාරියා විසින් පැමිණිලිකරුගේ වම් කම්බුලට පහරදී එම අය ශ්‍රවණාබාධ තත්ත්වයකට පත් කර ඇති බව නිරීක්ෂණය වන බැවින්, **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන්**

**සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය) යන නිලධාරියා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

<u>නිර්දේශය :</u>

ඉහත නිගමන අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ 13 (1) සහ 13(2) ව්‍යවස්ථාව පළමුවන වගඋත්තරකරු, දෙවන වගඋත්තරකරු සහ තෙවන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කිරීම සහ පළමුවන වගඋත්තරකරු විසින් 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

01. පළමු වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), විසින් පැමිණිලිකරුගේ වම් කම්මුලට පහරදී ශ්‍රවණාබාධ තත්ත්වයකට පත්කර වධහිංසා පැමිණ වූ බවට තහවුරුවී ඇති බැවින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ද, අත්තනෝමතික ආකාරයෙන් ක්‍රියාකරමින් පැමිණිලිකරු අත්තඅඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම හේතුවෙන් 12(1) සහ 13(1) හා 13(2) යන මූලික අයිතිවාසිකම් ද, පළමු වන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව පළමු වන වගඋත්තරකරු විසින් රු. 50,000/- ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර පළමුවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

02. පැමිණිලිකරු සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත අස්ථානගත වූ බවට ගොනුකරන ලද පැමිණිලි පිටපත දෙවන වගඋත්තරකරු වන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියාට ලබාදී තිබියදී, ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරමින් අත්තනෝමතික ආකාරයට ක්‍රියාකර පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පැමිණිලිකරුගේ 12(1) සහ 13(1), 13(2) යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇති බැවින්, දෙවන වගඋත්තරකරු වන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන විසින්, පැමිණිලිකරු වෙත රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර දෙවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

03. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී සහ ප්‍රකාශ සටහන් කර ගැනීමේදී අත්තනෝමතික ආකාරයෙන් සිය රාජකාරි සිදුකරමින් තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියා විසින් පැමිණිලිකරුගේ 12(1) සහ 13(1), 13(2) යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇති බැවින්, එම නිලධාරියා විසින්,

පැමිණිලිකරු වෙත රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර තුන්වන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

**පොලිස්පතිවරයා විසින්,**

01. පැමිණිලිකරු විසින් පොලිස් මූලස්ථානයේ මහජන සහන මැදිරිය වෙත CIB(I) 224/36 දරණ පැමිණිලි අංක යටතේ ගොනුකරන ලද පැමිණිල්ල ප්‍රකාරව ආරම්භ කර ඇති මූලික විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය.

02. පළමු වගඋත්තරකරු වන පො. ප. ගයාන් ක්‍රිශාන්ත (ස්ථානාධිපති -අපරාධ අංශය), නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

03. එසේම, දෙවන වගඋත්තරකරු වන පො. සැ.7859 ඩබ්. ආර්. ප්‍රියදර්ශන නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

04. තවද, තුන්වන වගඋත්තරකරුවන පො. සැ. 54016 එම්. එන්. ගුණසේකර නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2026. 07. 24 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා, - ක.දැ.ගැ.ස.
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

03. පොලිස්පති, - ඉහත නිර්දේශ ප්‍රකාරව පි.ගැ.
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

04. සභාපති, - අ.ක.ස.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

05. අධ්‍යක්ෂ, - අ.ක.ස.
මානව හිමිකම් කොට්ඨාශය,
එන්. එම්. පෙරේරා මාවත, කොටා පෙරසය, කොළඹ 08.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.